# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/49 - 2023 පෙබරවාරි මස 15 වැනි බදාදා - 2023.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මියයාම හේතුකොට ගෙන තුම්පනේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභාවේ අංක 07- ඉඩමේගම කොට්ඨාසයට තේරී පත්වූ සමරකෝන් මුදියන්සේලැ රූපසිංහ බණ්ඩාර සමරකෝන් අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම තුම්පනේ ප්‍රාදේශීය සභාවේ අංක 07- ඉඩමේගම කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා උඩගෙදර ශ්‍රී නිශ්ශංක මරවනාගොඩ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි හේවාගේ ධනුෂ්ක නලින් සම්පත් ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් උඩගෙදර ශ්‍රී නිශ්ශංක මරවනාගොඩ තුම්පනේ ප්‍රාදේශීය සභාවේ අංක 07- ඉඩමේගම කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

ආචාර්ය එච්.ඩී.එන්.සම්පත් ප්‍රනාන්දු,
තේරීම්භාර නිලධාරි,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 පෙබරවාරි මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

EOG 02-153

1A - G 38859 — 16 (2023/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*